# දැන්වීමයි

## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ පුරප්පාඩු

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා මණ්ඩලයීය සේවයේ ස්ථිරත්වය ලබා ඇති සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. **සේවා ගණය** : **කළමනාකාර** (MM 1-1)

**වැටුප් පරිමාණය** : MM 1-1 – 2016 රු:53,175 – 10x1375 – 15x1910 – 95,575/=

1.1 **තනතුර** : **සහකාර අධ්‍යක්ෂ (පුරප්පාඩු 01)** (ව්‍යාප්ති සේවා අංශය සඳහා)

**සුදුසුකම්** : **බාහිර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂ උපාධියක් ලබා තිබීම. (සමාජයීය විද්‍යා විෂයයක් හදාරා ඇති අයට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.)

   **සහ**

   උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ විෂයය ක්ෂේත්‍රයේ වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම හා අදාළ විෂය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සමත් වී තිබීම.

   **සහ**

   ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ විෂයය ක්ෂේත්‍රයේ වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කණිෂ්ඨ කළමනාකාර (JM) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

1.2 **තනතුර** : **අභ්‍යන්තර විගණක (පුරප්පාඩු 01)**

**සුදුසුකම්** : **බාහිර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂ උපාධියක් (වාණිජ්‍යය/ ගිණුම්කරණය/ ගණකාධිකරණය විෂයයකින්) ලබා තිබීම.

   **සහ**

   ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ විෂයය ක්ෂේත්‍රයේ වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

2. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) හෝ සහතික ලත් සංස්ථාපිත ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (ACCA) මධ්‍යම මට්ටමේ සුදුසුකම්

   **සහ**

   ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ විෂයය ක්ෂේත්‍රයේ වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කණිෂ්ඨ කළමනාකාර (JM) සේවා ශ්‍රේණියෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** අවුරුදු 22 ට නො අඩු හා අවු: 45 ට නො වැඩි අය විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**බඳවා ගැනීමේ ක්‍රමය :** විවෘත තරග විභාගයක් හා/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීම පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| අදාළ පළපුරුද්ද | ලකුණු 30 |
| අදාළ අතිරේක අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් | ලකුණු 30 |
| අනිකුත් කුසලතා හා කාර්ය සාධනය | ලකුණු15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය | ලකුණු 25 |
| මුළු ලකුණු ගණන | 100 |

02. **සේවා ගණය** : කණිෂ්ඨ කළමනාකාර (JM 1-1)

**වැටුප් පරිමාණය** : JM 1-1 – 2016 රු:42,600 – 10x755 – 18x1135 – 70,580/=

2.1 **තනතුර** : **පුස්තකාල හා ප්‍රලේඛන නිලධාරී (පුරප්පාඩු 06)**

**සුදුසුකම්** : **බාහිර අයදුම්කරුවන් සඳහා**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම (පුස්තකාල හා විඥාපන විද්‍යා විෂයය හදාරා ඇති අයට ප්‍රමුඛත්වය දෙනු ලැබේ)

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2 හෝ 3)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සහකාර (තාක්ෂණික) (MA 2-1) සේවා ගණයෙහි තොරතුරු සහකාර ii වන ශ්‍රේණියේ තනතුරක අදාළ විෂයය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
3. ආශ්‍රිත නිලධාරී (MA 3) සේවා ගණයෙහි පුස්තකාල සංවර්ධන සහකාර iii ශ්‍රේණියේ තනතුරක අදාළ විෂයය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

2.2 තනතුර : **පද්ධති විශ්ලේෂක (පුරප්පාඩු 01)**

**සුදුසුකම්** : **බාහිර අයදුම්කරුවන් සඳහා**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් (තොරතුරු තාක්ෂණය/ පරිගණක විද්‍යාව විෂයයක් සහිතව) ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2 හෝ 3)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. කළමනාකරණ සහකාර (තාක්ෂණික / තාක්ෂණික නොවන) (MA 2-1) / (MA1-1) සේවා ගණයන්හි තොරතුරු තාක්ෂණ සහකාර/ කළමනාකරණ සහකාර ii වන ශ්‍රේණියේ තනතුරක අදාළ විෂයය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

3. ආශ්‍රිත නිලධාරී (MA 3) සේවා ගණයෙහි පුස්තකාල සංවර්ධන සහකාර iii ශ්‍රේණියේ තනතුරක අදාළ විෂයය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

2.3 තනතුර : **සංරක්ෂණ නිලධාරී (පුරප්පාඩු 01)**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් (රසායන විද්‍යා විෂයය සහිතව) ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. කළමනාකරණ සහකාර (තාක්ෂණික) (MA 2-1) සේවා ගණයෙහි ලේඛන සංරක්ෂක/ තොරතුරු සහකාර ii වන ශ්‍රේණියේ තනතුරක අදාළ විෂයය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

2.4 තනතුර : **ව්‍යාප්ති නිලධාරී (පුරප්පාඩු 01)**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම. (සමාජයීය විද්‍යා විෂයයන් හදාරා ඇති අයට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.)

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2 හෝ 3)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. කළමනාකරණ සහකාර (තාක්ෂණික/තාක්ෂණික නොවන) (MA 2-1)/ (MA 1-1) සේවා ශ්‍රේණියන්හි තොරතුරු සහකාර/ කළමනාකරණ සහකාර ii වන ශ්‍රේණියේ තනතුරක අදාළ විෂයය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

3. ආශ්‍රිත නිලධාරී (MA 3) සේවා ශ්‍රේණියෙහි පුස්තකාල සංවර්ධන සහකාර iii ශ්‍රේණියේ තනතුරක අදාළ විෂයය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

2.5 තනතුර : **ගිණුම් නිලධාරී (පුරප්පාඩු 01)**

**බාහිර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් (වාණිජ්‍යය/ ගණකාධිකරණය/ ගිණුම්කරණය විෂයයක් සහිතව) ලබා තිබීම.
2. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) හෝ වරලත් කලමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) හෝ සහතික ලත් සංස්ථාපිත ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (ACCA) මධ්‍යම මට්ටමේ සුදුසුකම් සපුරා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

2. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) (MA 1-1) සේවා ශ්‍රේණියෙහි කළමනාකරණ සහකාර ii වන ශ්‍රේණියේ තනතුරක අදාළ විෂයය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

2.6 තනතුර : **පාලන ලේකම් (පුරප්පාඩු 01)**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) (MA 1-1) සේවා ගණයෙහි කළමනාකරණ සහකාර ii වන ශ්‍රේණියේ තනතුරක අදාළ විෂයය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සටහන :-** ඉහත 2.1 සිට 2.6 දක්වා වූ සියලුම තනතුරු සඳහා පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ දැනුම ලබා තිබිය යුතුය.

**වයස :** අවුරුදු 22 ට නො අඩු හා අවු: 45 ට නො වැඩි අය විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**බඳවා ගැනීමේ ක්‍රමය :** ලිඛිත තරග විභාගයක් හා/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීම පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| අදාළ අතිරේක පළපුරුද්ද | ලකුණු 30 |
| අදාළ අතිරේක සුදුසුකම් | ලකුණු 30 |
| වෙනත් කුසලතා හා කාර්ය සාධනයන් | ලකුණු15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය | ලකුණු 25 |
| මුළු ලකුණු ගණන | 100 |

ඉහත සඳහන් තනතුරු සඳහා අයදුම්කරන අයදුම්කරුවන් සම්පූර්ණ ජීව දත්ත තොරතුරු, අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් කර තම අයදුම්පත අදාළ සහතික පිටපත් ද සමඟ 2020.11.30 දින හෝ ඊට පෙර මා වෙත ඉදිරිපත් කළ යුතුය.

එයට අමතරව dg@mail.natlib.lk හෝ admin@mail.natlib.lk යන විද්‍යුත් ලිපිනය වෙත ද තම අයදුම්පත් යොමු කිරීම සඳහා අවස්ථාව සලසා දෙනු ලැබේ.

අයදුම්කරුවන් තම අයදුම්පත් අංශ ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත දක්වා ඇති සියලුම අවශ්‍යතා සම්පූර්ණ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඩබ්ලිව්. සුනිල්
අධ්‍යක්ෂ ජනරාල්
2020.11.16